## මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවයේ විධායක සේවා ගණයෙහි
## නීති නිලධාරී තනතුර සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය සංශෝධනය කිරීම.

<table>
<tr><th>ඡේද අංකය</th><th>දැනට තිබෙන පෙළ</th><th>ඡේද අංකය</th><th>යෝජිත සංශෝධනය</th><th>සංශෝධනයට හේතුව</th></tr>
<tr>
<td>6.1</td>
<td>අනුමත තනතුරු නාම හා අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන්
<table>
<tr><th>අනුමත තනතුරු නාමය</th><th>තනතුර අනුමත ශ්‍රේණිය</th><th>අනුමත තනතුරු සංඛ්‍යාව</th><th>කාර්යයන්</th></tr>
<tr><td>නීති නිලධාරී</td><td>III/ II</td><td>06</td><td>- නීතිපති දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණ කාර්යය<br>- අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවෙහි නිලධාරීන් රාජකාරී විෂය පථයට අදාළ කරුණක් මත<br>-වගඋත්තරකරුවන් වන නඩු සම්බන්ධයෙන් උපදෙස් ලබාදීම හා නීතිමය මඟ පෙන්වීම.<br>- පළාත් සභාවේ සියලුම ආයතන සඳහා ප්‍රඥප්ති සකස් කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය නෛතික කටයුතු සිදුකිරීම.<br>- ආයතන ප්‍රධානියා විසින් තනතුරට අදාළව පවරනු ලබන අනෙකුත් කාර්යයන්</td></tr>
</table>
</td>
<td>6.1</td>
<td>අනුමත තනතුරු නාම හා අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන්
<table>
<tr><th>අනුමත තනතුරු නාමය</th><th>තනතුර අනුමත ශ්‍රේණිය</th><th>අනුමත තනතුරු සංඛ්‍යාව</th><th>කාර්යයන්</th></tr>
<tr><td>නීති නිලධාරී</td><td>III/ II<br>I</td><td>05<br>01</td><td>- නීතිපති දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණ කාර්යය<br>- අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවෙහි නිලධාරීන් රාජකාරී විෂය පථයට අදාළ කරුණක් මත<br>-වගඋත්තරකරුවන් වන නඩු සම්බන්ධයෙන් උපදෙස් ලබාදීම හා නීතිමය මඟ පෙන්වීම.<br>- පළාත් සභාවේ සියලුම ආයතන සඳහා ප්‍රඥප්ති සකස් කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය නෛතික කටයුතු සිදුකිරීම.<br>- ආයතන ප්‍රධානියා විසින් තනතුරට අදාළව පවරනු ලබන අනෙකුත් කාර්යයන්</td></tr>
</table>
</td>
<td>2013-01-01 දිනට අනුමත කාර්ය මණ්ඩල වාර්තාව අනුව නීති නිලධාරී III , II හා I ශ්‍රේණිවල තනතුරු අනුමත වී ඇති බැවින්, තනතුර අනුමත ශ්‍රේණිය අනුමත තනතුරු සංඛ්‍යාව සංශෝධනය කිරීම.</td>
</tr>
<tr>
<td>6.2</td>
<td>ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව : 06 යි. මෙම සංඛ්‍යාව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය මත ප්‍රධාන ලේකම් විසින් වරින් වර සංශෝධනය කරනු ලැබේ.</td>
<td>6.2</td>
<td>ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව : 06 යි. මෙම අනුමත තනතුරු සංඛ්‍යාව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් කලින් කලට අනුමත කරන පරිදි වෙනස් වේ.</td>
<td>අනුමත තනතුරු සංඛ්‍යාව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් කලින් කලට සංශෝධනය කිරීම.</td>
</tr>
</table>

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2015/09/22 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

| | | | | |
|---|---|---|---|---|
| 10.1.2 | **III ශ්‍රේණියේ සිට II ශ්‍රේණියට උසස් කිරීම**<br>සුවිශේෂි කාර්ය සාධනය අනුව<br><u>10.1.2.1 සපුරාලිය යුතු සුදුසුකම්</u><br>I. පත්වීම ස්ථිර කර තිබීම.<br>II. සේවා ගණයේ III වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර හයක (06) සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක හයම (06) නියමිත දිනට උපයාගෙන තිබීම.<br>III. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව පූර්වාසන්නතම වසර හය (06) තුළ සුවිශේෂි කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.<br>IV. උසස්වීම් දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.<br>V. අදාළ මට්ටමේ අනික් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය නියමිත කාලය තුළදී ලබාගෙන තිබීම.<br>VI. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත්වී තිබීම.<br><u>10.1.2.2 උසස් කිරීමේ ක්‍රමය</u> :<br>ඉහත සුදුසුකම් සපුරාලන නිලධරයන්ට පත්කිරීම් බලධාරියා විසින් පවත්වනු ලබන ලිඛිත අභියෝග්‍යතා පරීක්ෂණයකට පෙනී සිටිය හැක. (විෂය නිර්දේශය : ඇමුණුම 04) ඉන් සමත්වන්නන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්කිරීම් බලධාරියා විසින්අදාළ සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ. අදාළ සෙසු අවශ්‍යතාවයන්ද සම්පූර්ණ කර ඇති නිලධරයන් පත්කිරීමේ දින සිට වසර හයක්(06) සම්පූර්ණ වන දිනට ක්‍රියාත්මක වන පරිදි II ශ්‍රේණියට උසස් කිරීම පත් කිරීම් බලධාරියා විසින් සිදුකරනු ලැබේ.<br>සටහන<br>• සුවිශේෂි කාර්යසාධනය යටතේ උසස් කිරීම ලබාදීමේදී පවත්වනු ලබන පරීක්ෂණයෙන් සමත්වීම සඳහා අවම වශයෙන් ලකුණු 60%ක් ලබා ගත යුතුය. තවද සුවිශේෂි කාර්යසාධනය යටතේ උසස් කිරීමේ පරීක්ෂණය වර්ෂයකට එක් වරක් පවත්වනු ලැබේ. එක් නිලධරයකුට මෙම පරීක්ෂණයට පෙනී සිටිය හැක්කේ එක් වතාවක් පමණි. | | ඉවත් කරන ලදී.<br>ගරු ආණ්ඩුකාරතුමිය විසින්<br>2015/09/22 දින<br>අනුමත කරන ලදී.<br>ආණ්ඩුකාර ලේකම් | වැටුප් කොමිෂන් සභාව විසින් සුවිශේෂි කාර්ය සාධනය අනුව උසස් කිරීම ඉවත් කිරීමට උපදෙස් ලබා දී තිබීම. |

<table>
<tr>
<td></td>
<td>• නිලධරයකුට පාලනය කළ නොහැකි විශේෂ හේතුවක් මත නියමිත දිනට සුවිශේෂී කාර්යසාධනය යටතේ උසස් කිරීමේ පරීක්ෂණයට පෙනී සිටීමට නොහැකි වූ අවස්ථාවන්හිදී පසුව පැවැත්වෙන අභියෝග්‍යතා පරීක්ෂණයට එම නිලධරයාට පෙනී සිටිය හැක. එවැනි නිලධරයකු සුවිශේෂී කාර්යසාධනය යටතේ උසස් කිරීම සිදුකරන දිනය ලෙස සලකනුයේ එම විභාගය සමත්වූ දිනය වේ.<br><br>සංලක්ෂය<br>1. සුවිශේෂී කාර්යසාධනය ඇගයීමේ ක්‍රමවේදයක් රජය විසින් හඳුන්වාදී ක්‍රියාත්මක කරන තෙක් දැනට ක්‍රියාත්මක වන වාර්ෂික කාර්යසාධන ඇගයීමේදී සතුටුදායක මට්ටම හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම්කරනු ලැබ ඇති තැනැත්තන්ට සුවිශේෂී කාර්යසාධනය යටතේ උසස් කිරීම සඳහා වන ලිඛිත අභියෝග්‍යතා පරීක්ෂණය සඳහා පෙනී සිටීමට අවස්ථාව සලසා දෙනු ලැබේ.</td>
<td></td>
<td>ඉවත් කරන ලදී.</td>
<td>වැටුප් කොමිෂන් සභාව විසින් සුවිශේෂී කාර්ය සාධනය අනුව උසස් කිරීම ඉවත් කිරීමට උපදෙස් ලබා දී තිබීම</td>
</tr>
<tr>
<td>ඇමුණුම 04</td>
<td><u>මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ විධායක සේවා ගණයෙහි නීති නිලධාරී තනතුරෙහි සුවිශේෂී කාර්යසාධනය යටතේ උසස් වීම සඳහා වන අභියෝග්‍යතා පරීක්ෂණය</u><br><br>1.විභාගයේ නම : මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ විධායක සේවා ගණයෙහි නීති නිලධාරී තනතුරෙහි සුවිශේෂී කාර්යසාධනය යටතේ උසස් වීම සඳහා වන අභියෝග්‍යතා පරීක්ෂණය<br><br>2. විභාගය පිළිබඳ විස්තර :<br>
<table>
<tr><th>ප්‍රශ්න පත්‍රය</th><th>කාලය</th><th>මුළු ලකුණු</th><th>සමත් ලකුණු</th></tr>
<tr><td>අභියෝග්‍යතා පරීක්ෂණය</td><td>පැය 01</td><td>100</td><td>60</td></tr>
</table>
<br>3. පවත්වනු ලබන බලධරයා :<br>පත්වීම් බලධාරියා වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් හෝ පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ලබන වෙනත් සුදුසු ආයතනයක් මගින් හෝ පවත්වනු ලැබේ.</td>
<td></td>
<td>ඉවත් කරන ලදී.<br><br>ගරු ආණ්ඩුකාරතුමිය විසින්<br>2015/09/22 දින<br>අනුමත කරන ලදී.<br>ආණ්ඩුකාර ලේකම්</td>
<td>වැටුප් කොමිෂන් සභාව විසින් සුවිශේෂී කාර්ය සාධනය අනුව උසස් කිරීම ඉවත් කිරීමට උපදෙස් ලබා දී තිබීම.</td>
</tr>
</table>

<table>
<tr>
<td></td>
<td>
4. පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යනවග : අවශ්‍යතාවය පරිදි / වසරකට එක්වරක්<br>
5. විභාගය සඳහා වන විෂය නිර්දේශය :
<table>
<tr><th>ප්‍රශ්න පත්‍රයේ නම</th><th>විෂය නිර්දේශය</th></tr>
<tr><td>අභියෝගතා පරීක්ෂණය</td><td>තමා වෙත පැවරෙන සියලු කාර්යයන් සාමාන්‍ය කාර්යසාධන මට්ටම ඉක්මවූ කාර්යක්ෂමතාවයකින් යුතුව ඉටුකිරීම සඳහා අවශ්‍ය වන දැනුම, කුසලතා හා ආකල්ප මෙන්ම අපේක්ෂිත ප්‍රවීනතාව අත්පත් කරගෙන තිබීම යන්න මැන බැලීම සඳහා සකස් වූ ප්‍රශ්න පත්‍රයකි.</td></tr>
</table>
</td>
<td></td>
<td>ඉවත් කරන ලදී.</td>
<td>වැටුප් කොමිෂන් සභාව විසින් සුවිශේෂී කාර්ය සාධනය අනුව උසස් කිරීම ඉවත් කිරීමට උපදෙස් ලබා දී තිබීම.</td>
</tr>
</table>

කොමිෂන් සභාවේ නිර්දේශය : නිර්දේශ කරමි.

01. ගාමිණී දසනායක මහතා (සභාපති) ..............................

02. යූ.ඒ.බෝගහපිටිය මහතා (සාමාජික) ..............................

03. පී.පී.එස්.ඒ.දිසානායක මිය (සාමාජික) ..............................

04. වෛත්‍යාලිංගම් නන්දකුමාර් මහතා (සාමාජික) ..............................

05. ඒ.ජේ.එම්.මොහිදීන් නිස්තාර් මහතා (සාමාජික) ..............................

මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය :-

අනුමත කරමි

..............................

මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර

20.15/09/22